


★

# දිනමිණ


The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | දිනමින

ශ්‍රී බුධ වර්‍ෂ 2564ක් වූ උඳුවප් අව දසවක තිථිය ලත් කිවි දින | කාණ්ඩය 112 | පත්‍රය 20 | පිටු 32 මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 ජනවාරි 08 සිකුරාදා





# විදෙස් ණයවලින් පැවැති ආණ්ඩු ඇරඹූ ව්‍යාපෘති 800ක වැඩ අතරමඟ නැවතිලා

## ඩොලර් බිලියන 4.5ක ණය වාරික ගෙවුවත් ජනතාවට ප්‍රතිලාභ නෑ

## ජනපති කියයි

ධනුෂ්ක ගොඩකුඹුර

විදේශ ආධාර සහ අය-වැය යෝජනා මත විවිධ කාලවලදී විවිධ ආණ්ඩු ආරම්භ කළ ව්‍යාපෘති 800කට වැඩි ප්‍රමාණයක කටයුතු මේ වන විට අතරමග නතර වී තිබෙන බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ''ගම සමඟ පිළිසඳරක් තුළින් වැඩ සමඟ යළි ගමට'' ජාතික වැඩසටහනට අරලියගහ මන්දිරයේදී ඊයේ (07) එක් වෙමින් ප්‍රකාශ කළේය.

පිට 6

# සද්භාවයෙන් වැඩ කරන රාජ්‍ය නිලධාරීන්ට ව්‍යවස්ථාවෙන්ම ආරක්ෂාව දෙනවා

## ...මැති රාජ්‍ය නිලධාරීන්ට කියයි

... ගොඩකුඹුර

...ද්භාවයෙන් කටයුතු කරන රාජ්‍ය නිලධාරීන් හට දඬුවම් කළ නොහැකි ආකා-...රයට ව්‍යවස්ථානුකූල ආරක්ෂාවක් සැලසීමට පියවර ගන්නා බව අග්‍රාමාත්‍ය ...හින්ද රාජපක්ෂ මහතා ප්‍රකාශ ඊයේ (07) කළේය.

පිට 6

# කොවිඩ් සිරුරු ආදාහන තීන... වෙනසක් ...




## විශේෂඥ වාර්තාව තහවුරු කළා

ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් රෝගයෙන් මිය යන අයගේ මෘතදේහ ආදාහනය කිරීම සම්බන්ධ තීන්දුවේ කිසිදු වෙනසක් නැතැයි සෞඛ්‍ය ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය පාර්ලිමේන්තුවේදී ඊයේ (07) ප්‍රකාශ කළාය.

පිට 6





## මධ්‍යම තැපෑලට එවූ

# කෝටි 13ක මත්පෙති අත්අඩංගුවට

දකුණු ආසියාවේ ලොකුම වැටලීම පිට 6

# පසුගිය ආණ්ඩු සමයේ නොගෙවූ ව්‍යාපෘති බිල් කෝටි 24,300ක්

## මුදල් අමාත්‍යාංශයේ ලේකම්

ධනුෂ්ක ගොඩකුඹුර

පසුගිය ආණ්ඩුව සමයේ ආරම්භ කරන ලද ව්‍යාපෘති සඳහා නොගෙවූ බිල්පත්වල වටිනාකම 2020 වර්ෂය ආරම්භ වන විට රුපියල් කෝටි 24,300ක් වූ බව මුදල් අමාත්‍යාංශයේ ලේකම් එස්. ආර්. ආටිගල මහතා ඊයේ (07) ප්‍රකාශ කළේය.

පිට 6

# පසුගිය වසරේදී රේගුව මිලියන 251ක වැටලීම් කරලා

සුභාෂිණී සේනානායක

ගෙවුණු 2020 වසරේ කොවිඩ් අභියෝග මධ්‍යයේ වුවද ශ්‍රී ලංකා රේගුව රුපියල් මිලියන 251ක වැටලීම් කළ බව රේගු මාධ්‍ය ප්‍රකාශක අතිරේක රේගු අධ්‍යක්ෂ ජෙනරාල් සුනිල් ජයරත්න මහතා 'දිනමිණ' ට (07) ඊයේ පැවසීය.

පිට 6

# එස්ඩබ්ආර්ඩී බණ්ඩාරනායක ජන්ම දිනය අද



ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිර්මාතෘ හිටපු අග්‍රාමාත්‍ය දිවංගත එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ගේ 122වැනි ජන්ම දිනය අද (08) යෙදී තිබේ.

පිට 6



'ගම සමඟ පිළිසඳරක් තුළින් වැඩ සමඟ යළි ගමට' ජාතික වැඩසටහනට සමගාමීව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ සාකච්ඡාවක් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී ඊයේ (07) පැවැත්වුණු අවස්ථාව.

# වරාය රැක ගැනීමේ සේවක සටනට සහාය දෙනවා



නදී මාණික්කගේ

වරාය රැක ගැනීම වෙනුවෙන් වරාය සේවකයන් ගෙන යන සටනට කොන්දේසි විරහිතව සහයෝගය දක්වන බව ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා මහතා බත්තරමුල්ල පක්ෂ කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදී ඊයේ (07) පැවසුවේය.

පිට 6






පිට 6

# එජාප ජාතික ලැයිස්තුවෙන් රුවන්?



# දත් ගන්න

# පාස්කු දා ප්‍රහාරයේ වාර්තාව ලද විගස අධි චෝදනා ගොනු කරනවා



ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න

# බඳ පටියේ සඟවා බෝගම්බරට මත්ද්‍රව්‍ය ගෙන ගිය ජේලර් අල්ලයි

අසේල කුරුළුවංශ

නිල ඇඳුමේ බඳ පටිය තුළ රහසිගතව රඳවා බෝගම්බර නිදුම්බර බන්ධනාගාරය තුළට හෙරොයින්, අයිස් ඇතුළු මත්ද්‍රව්‍ය තොගයක් රැගෙන යෑමට උත්සාහ කළ බන්ධනාගාර නියාමකවරයකු බන්ධනාගාර නිලධාරීන් විසින් ඊයේ